# අභ්‍යන්තර කටයුතු ඒකකය (Internal Affairs Unit – IAU)

## ප්‍රධාන අරමුණු, වගකීම් හා කාර්යයන් සහ පැමිණිලි/තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රම

### අභ්‍යන්තර කටයුතු ඒකකය

රාජ්‍ය ආයතන තුළ අල්ලස් හා දූෂණ වැළැක්වීම, ආයතනික අවංකභාවය හා සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කිරීම, විනිවිදභාවය හා වගවීම ශක්තිමත් කිරීම සහ අක්‍රමිකතා පිළිබඳ තොරතුරු හා පැමිණිලි ආරක්ෂිතව ඉදිරිපත් කිරීමට ජනතාවට සහ නිලධාරීන්ට පහසු ක්‍රමවේදයක් සැලසීම සඳහා අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU) ස්ථාපිතකර ඇත. මෙම ඒකකයේ කටයුතු 2025 පෙබරවාරි 18 දිනැති ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ අංක PS/SB/Circular/2/2025 මගින් නියම කර ඇති ආයතනික අවංකභාවය හා දූෂණ විරෝධී ක්‍රියාමාර්ග සමඟ අනුකූලව ක්‍රියාත්මක වේ.

### පැමිණිලි, තොරතුරු හා අක්‍රමිකතා වාර්තා කිරීම

ආයතනයේ නිලධාරියෙකුගේ ක්‍රියාකාරකමක්, ආයතනය විසින් සපයනු ලබන සේවාවක් හෝ ආයතනය තුළ සිදුවන බවට සැක කෙරෙන දූෂණ, අල්ලස්, අක්‍රමිකතා හෝ සදාචාර විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් තොරතුරු/පැමිණිලි IAU වෙත ඉදිරිපත් කළ හැකිය. සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ද ඉදිරිපත් කළ හැකිය.

**පැමිණිලි/තොරතුරු පහත ක්‍රමවලින් ඉදිරිපත් කළ හැකිය:**

- ආයතන පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති IAU පැමිණිලි පෙට්ටිය වෙත ලිඛිත පැමිණිල්ලක්/තොරතුරක් යොමු කිරීම.
- තැපෑල මගින් IAU වෙත ලිඛිත පැමිණිල්ලක්/තොරතුරක් යොමු කිරීම.
- විද්‍යුත් තැපෑල (E-mail) මගින් පැමිණිල්ල/තොරතුර යොමු කිරීම.
- දුරකථනය මගින් IAU වෙත තොරතුරු ලබාදීම.
- WhatsApp මගින් තොරතුරු/පැමිණිලි යොමු කිරීම.
- ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇති QR කේතය ස්කෑන් කර අදාළ පැමිණිලි/තොරතුරු පෝරමය හරහා ඉදිරිපත් කිරීම.

### IAU හි ප්‍රධාන අරමුණු

1. ආයතනය තුළ දූෂණය වැළැක්වීම සහ සුපිළිපන්න සංස්කෘතියක් වර්ධනය කිරීම.
2. ආයතනයේ සියලු ක්‍රියාකාරකම්වල විනිවිදභාවය හා වගවීම සහතික කිරීම සහ ආයතනික ක්‍රියාකාරකම් සහ තීරණ සම්බන්ධ තොරතුරු වෙත මහජන ප්‍රවේශය සහතික කිරීම.
3. ආයතනය තුළ සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කිරීම.
4. විශමාචාර වාර්තා කිරීම දිරිගැන්වීම, තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීම සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි ක්‍රමවේදයක් සකස් කිරීම.
5. නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) සමඟ සහයෝගයෙන් නීති බලාත්මක කිරීමට සහාය වීම.

### පැමිණිලි සඳහා සම්බන්ධතා තොරතුරු

ආයතනය:- රාජ්‍ය දැව සංස්ථාව
ලිපිනය:- අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU), රාජ්‍ය දැව සංස්ථාව

විද්‍යුත් තැපෑල :- iaustc48@gmail.com/ iaustc@timco.lk
දුරකථන:- 0112885853
WhatsApp:- 0768922503

QR කේතය:-

Internal Affairs Unit

# ප්‍රධාන අරමුණු, වගකීම් හා කාර්යයන් සහ පැමිණිලි/තොරතුරු ඉදිරිපත් කිරීමේ ක්‍රම

# අභ්‍යන්තර කටයුතු ඒකකය (Internal Affairs Unit – IAU)

## 1. අභ්‍යන්තර කටයුතු ඒකකය පිළිබඳව

රාජ්‍ය ආයතන තුළ අල්ලස් හා දූෂණ වැළැක්වීම, ආයතනික අවංකභාවය හා සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කිරීම, විනිවිදභාවය හා වගවීම ශක්තිමත් කිරීම සහ අක්‍රමිකතා පිළිබඳ තොරතුරු හා පැමිණිලි ආරක්ෂිතව ඉදිරිපත් කිරීමට ජනතාවට සහ නිලධාරීන්ට පහසු ක්‍රමවේදයක් සැලසීම සඳහා අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU) ස්ථාපිත කර ඇත.

මෙම ඒකකයේ කටයුතු 2025 පෙබරවාරි 18 දිනැති ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ අංක PS/SB/Circular/2/2025 මගින් නියම කර ඇති ආයතනික අවංකභාවය හා දූෂණ විරෝධී ක්‍රියාමාර්ග සමඟ අනුකූලව ක්‍රියාත්මක වේ.

## 2. IAU හි ප්‍රධාන අරමුණු

1. ආයතනය තුළ දූෂණය වැළැක්වීම සහ සුපිළිපන්න සංස්කෘතියක් වර්ධනය කිරීම.
2. ආයතනයේ සියලුම ක්‍රියාකාරකම්වල විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සහ ආයතනික ක්‍රියාකාරකම් සහ තීරණ සම්බන්ධ තොරතුරු වෙත මහජන ප්‍රවේශය සහතික කිරීම.
3. ආයතනය තුළ සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කිරීම.
4. විෂමාචාර වාර්තා කිරීම දිරිගැන්වීම, තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීම සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි ක්‍රමවේදයක් සකස් කිරීම.
5. නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් නීති බලාත්මක කිරීමට සහාය වීම.

## 3. IAU හි ප්‍රධාන වගකීම් හා කාර්යයන්

1. ආයතනය තුළ පවතින පද්ධතිමය බාධාවන් (systemic bottlenecks) හඳුනා ගැනීම සඳහා වත්මන් ක්‍රියා පටිපාටි සහ චක්‍රලේඛ පරීක්ෂා කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඒවා සරල කිරීම.
2. දූෂණ අවදානම් ඇගයීම් (Corruption Risk Assessment) සිදු කිරීම මගින් ආයතනය තුළ දූෂණයට හා සදාචාර විරෝධී හැසිරීම්වලට ගොදුරු විය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ඉලක්කගත වැළැක්වීමේ පියවර ගැනීම.
3. ආයතනයේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සකස් කරන ලද නිශ්චිත දූෂණ විරෝධී අරමුණු සහ උපායමාර්ග ඇතුළත් ආයතනික සුපිළිපන්න ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
4. ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම සමඟ ආයතනික ප්‍රතිපත්ති සහ භාවිතයන් පෙළගස්වමින් ජාතික දූෂණ විරෝධී උපාය මාර්ගවලට අනුකූල වීම.

5. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ඇතුළු ජාතික හා ජාත්‍යාන්තර දූෂණ විරෝධී නීති සමඟ ආයතනයේ අනුකූලතාව ඇගයීම සඳහා අනුකූලතා සමාලෝචන (Compliance Assessments) සිදු කිරීම සහ වැඩි දියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම.
6. සියලුම රාජ්‍ය නිලධාරීන් සහ සේවා නියුක්තිකයින් සඳහා වත්කම් ප්‍රකාශන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා නියෝග සහ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට අනුකූලව බැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය කිරීම.
7. ආයතනය තුළ දූෂණ සහ සදාචාර විරෝධී හැසිරීම් සම්බන්ධ පැමිණිලි භාර ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ආරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීම, එවැනි සියලුම පැමිණිලි සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් හෝ ඒකක විසින් කඩිනමින් කටයුතු කරන බවට සහතික වීම සහ විනිවිදභාවය සහ වගවීම සහතික කරමින් විමසීම් සිදු කරන අදාළ පාර්ශ්වකරුවන් වෙත නිරන්තර යාවත්කාලීන කිරීම් ලබා දීම. අවශ්‍ය පරිදි, දූෂණ විරෝධී පනත යටතේ විමර්ශනය සඳහා අදාළ කරුණු, සොයාගැනීම් හෝ තොරතුරු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කිරීම.
8. ආයතනය විසින් සපයනු ලබන සේවාවන් විස්තර කෙරෙන පුරවැසි ප්‍රඥප්තියක් සංවර්ධනය කර ප්‍රකාශයට පත් කිරීම.
9. රාජ්‍ය නිලධාරීන් විසින් පිළිපැදිය යුතු ප්‍රමිතිගත ආචාර ධර්ම සංග්‍රහයක් ඇතුළුව, සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ බලාත්මක කිරීම.
10. දූෂණ විරෝධී මූලධර්මවලට කැපවී සිටීමට අභිප්‍රේරණයක් ලෙස කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ දැනුවත් කිරීම ඇතුළු අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම.
11. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ජාතික දූෂණ විරෝධී රාමුව මගින් මෙහෙයවනු ලබන සුපිළිපන්න ඇගයීම් ක්‍රියාවලින් සඳහා ආයතනය සහභාගී වන බව සහ ඒ සමඟ පෙළගැසෙන බව සහතික කරමින්, ජාතික දූෂණ විරෝධී සුපිළිපන්න ඇගයීම (National Anti-Corruption Integrity Assessment) සඳහා ආයතනික කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම
12. ඒකකයේ රාජකාරි ක්‍රියාත්මක කිරීමේදී අඛණ්ඩ මගපෙන්වීම් සහ සහාය ලබා ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම.
13. අභ්‍යන්තර කටයුතු ඒකකයෙහි ක්‍රියාකාරකම්, දූෂණ විරෝධී මුලපිරීම්වල ප්‍රගතිය, මුහුණ දෙන අභියෝග සහ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ සාරාංශගත කරමින් කාලානුරූපී සහ වාර්ෂික වාර්තා සකස් කිරීම.
14. පුද්ගලික අංශයේ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් සුපිළිපන්නතාවය වර්ධනය කිරීම සඳහා වන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

## 4. පැමිණිලි, තොරතුරු හා අක්‍රමිකතා වාර්තා කිරීම

ආයතනයේ නිලධාරියෙකුගේ ක්‍රියාකාරකමක්, ආයතනය විසින් සපයනු ලබන සේවාවක් හෝ ආයතනය තුළ සිදුවන බවට සැක කෙරෙන දූෂණ, අල්ලස්, අක්‍රමිකතා හෝ සදාචාර විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් තොරතුරු/පැමිණිලි IAU වෙත ඉදිරිපත් කළ හැකිය. සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ද ඉදිරිපත් කළ හැකිය.

පැමිණිලි/තොරතුරු පහත ක්‍රමවලින් ඉදිරිපත් කළ හැකිය:

- ආයතන පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති IAU පැමිණිලි පෙට්ටිය වෙත ලිඛිත පැමිණිල්ලක්/තොරතුරක් යොමු කිරීම.
- තැපැල මඟින් IAU වෙත ලිඛිත පැමිණිල්ලක්/තොරතුරක් යොමු කිරීම.
- විද්‍යුත් තැපැල (E-mail) මඟින් පැමිණිල්ල/තොරතුර යොමු කිරීම.
- දුරකථනය මඟින් IAU වෙත තොරතුරු ලබාදීම.
- WhatsApp මඟින් තොරතුරු/පැමිණිලි යොමු කිරීම.
- ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇති QR කේතය ස්කෑන් කර අදාළ පැමිණිලි/තොරතුරු පෝරමය හරහා ඉදිරිපත් කිරීම.

## 5. පැමිණිලි සඳහා සම්බන්ධතා තොරතුරු

| | |
|---|---|
| ආයතනය | රාජ්‍ය දැව සංස්ථාව |
| තැපැල් ලිපිනය | අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU), රාජ්‍ය දැව සංස්ථාව |
| විද්‍යුත් තැපැල | iaustc48@gmail.com/ iaustc@timco.lk |
| දුරකථන | 0112885853 |
| WhatsApp | 0768922503 |
| QR කේතය | Internal Affairs Unit |